## බස්නාහිර පළාතේ පළාත් සභාව - සභා රැස්වීම

# 2016 මැයි මස 03 වන දින පෙ.ව 9.30 ට

## න්‍යාය පත්‍රය

I. සභාපතිවරයාගේ නිවේදන

II. ලිපි ලේඛන පිළිගැන්වීම

III. කාරක සභා වාර්තා පිළිගැන්වීම

IV. පෙත්සම්

V. ප්‍රශ්න

**01. ගරු පී. ඩී. අබේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතුයාවිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-04-05 වන දින අසන ලද ප්‍රශ්ණය.**

**(ප්‍ර/vi(1)/16/28)**

(අ). හොරණ දික්හේනපුර මාර්ගය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය මගින් කාපට් අතුරා තිබේද?

(ආ). ඒ සඳහා වැය කර ඇති මුදල කොපමණද?

(ඇ). නිමකර ඇති ප්‍රමාණයේ දිග සහ පළල කොපමණද?

(ඇ). එම පාරේ ගල් ඇතිරීමට වැය කළ මුදල කොපමණද?

(ඉ). මෙම ව්‍යාපෘතිය ඉටුකරන ලද කොන්ත්‍රාත්කරු හෝ කොන්ත්‍රාත් සමාගම කුමක්ද?

(ඊ). අදාල මුදලට කර ඇති ඉදිකිරීම් ගැන ඔබතුමා සෑහීමට පත්වේද?

(උ). සෑහීමට පත් නොවන්නේ නම්, ඒ සම්බන්ධව ගන්නා පියවර කුමක්ද?

02. **ගරු පී.ඩී. අබේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමූපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, වතුයටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-04-05 වන දින අසන ලද ප්‍රශ්ණය.**

(ප්‍ර/vi(1)/16/29)

(අ). 2012 වර්ෂයේදී රු. 164,232,954 ක් වැය කරමින් බස්නාහිර පළාතේ මාර්ග සංවර්ධන අධිකාරිය විසින් පෞද්ගලික ආයතනයක් හරහා කොන්ක්‍රීට් ඇතුරුම් යන්ත්‍ර 02 ක් හා කර්බර් ඇතුරුම් යන්ත්‍රයක් මිලට ගෙන තිබේද?

(ආ). මිල දී ගෙන තිබේනම් එම මුදල් වැයකළේ කිනම් ආකාරයකටද?

(ඇ). 2012 නොවැම්බර් මස 23 වන දින අදාල යන්ත්‍ර අධිකාරිය වෙත භාර ගෙන ඇත්ද?

(ඈ). එම යන්ත්‍ර මේ දක්වා ප්‍රයෝජනයට නොගෙන තිබේද?

(ඉ). මෙම යන්ත්‍ර සඳහා වාර්ෂික රක්ෂණ වාරික මුදල කොපමණද?

(ඊ). ප්‍රයෝජනයට නොගන්නා යන්ත්‍ර රක්ෂණය කිරීමෙන් අධිකාරිය පාඩු ලබන බව පිළිගන්නේද?

(උ). මෙතෙක් කල් මෙම යන්ත්‍ර රක්ෂණය කිරීමෙන් අධිකාරිය ලැබූ පාඩුව කොපමණද?

(ඌ). ඉහත සඳහන් විනාශකාරි මුදල් ආයෝජනය සම්බන්ධව ඔබතුමා ගන්නා පියවර කුමක්ද?

03. ගරු කේ. ඩී. අරුණ දීපාල් මන්ත්‍රීතුමා විසින් ගරු සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන, පරිවාස හා ළමා රක්ෂක සේවා, කාන්තා කටයුතු සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-04-05 වන දින අසන ලද ප්‍රශ්නය.

(ප්‍ර/vi(1)/16/30)

(අ). 2000 වර්ෂයේ සිට මේ දක්වා පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු යටතේ ඉදිරිපත් කළ යෝජනා ගණන කීයද?

(ආ). ඉන් සාකච්ඡාවට (විවාදයට) භාජනය කළ ගණන කීයද?

(ඇ). ඉවත් කරගත් හෝ ප්‍රතික්ෂේප කළ ගණන කීයද?

(ඈ). ඒකඡන්දයෙන් සම්මත වූ ගණන කීයද?

(ඉ). වැඩි ඡන්දයෙන් සම්මත වූ ගණන කීයද?

(ඊ). පරාජයට පත් වූ යෝජනා ගණන කීයද?

(උ). එකී යෝජනා අතරින් අධ්‍යාපන, සෞඛ්‍ය, සමූපකාර, නීති හා ප්‍රඥප්ති, ප්‍රවාහන වශයෙන් එක් එක් විෂයට අදාල යෝජනා කොපමණද?

(ඌ). එම සම්මත වූ යෝජනා අතරින් මේ වන විට ක්‍රියාත්මක වූ යෝජනා මොනවාද? කුමන වර්ෂයේ සිටද? කුමන අමාත්‍යාංශය යටතේද?

(එ). වාර්ෂිකව අය-වැය යෝජනා සාකච්ඡාවේදී මෙම සම්මත යෝජනා කෙරෙහි අවධානය යොමු කර සලකා බලා තිබේද? ඒ කුමන වසරේද?

(ඒ). සභාවේ මන්ත්‍රීවරුන්ගේ සම්මත යෝජනා ක්‍රියාත්මක කිරීමට සුදුසු ක්‍රමවේදයක් සකසා තිබේද? එසේ නම් එය කුමක් ද?

(ඔ). සම්මත වූ යෝජනා ක්‍රියාත්මක නොකරන්නේ කාගේ නොහැකියාව නිසාද? ඒ සඳහා වගකිවයුත්තේ කවුද?

(ඕ). මෙතෙක් සම්මත යෝජනා නැවත සලකා බලා ඉදිරි ක්‍රියාමාර්ග ගැනීමට මෙම සභාවෙන් කමිටුවක් පත් කිරීම සුදුසු බව අදහස් කරන්නේද? එසේනම් ඒ සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද?

04. ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් 2016-04-05 වන දින අසන ලද ප්‍රශ්ණය. (ප්‍ර/vi(1)/16/31)

(අ). බස්නාහිර පළාත් සභාව යටතේ පළාතේ ඇති ඉඩම් දීර්ඝ කාලීන හෝ කෙටි කාලීන බදු ක්‍රමය යටතේ බදු දී තිබේද?

(ආ). (i). ඉඩමේ නම හා ප්‍රමාණය ,

(ii). ඉඩම පිහිටි ස්ථානය ,

(iii). බදු කුලී පදනම ,

(iv). බදු ගැණුම්කරුගේ නම ,

(V). ආයතනයක් පවත්වාගෙන යන්නේ නම් ආයතනයේ නම ,

(vi). බදු දුන් දිනය ,

(vii). බදු කාලය අවසන් දිනය ,

(viii). 2016.03.15 දිනට හිඟ බදු කුලී ප්‍රමාණය, වාර්තාවක් ලෙස ලබා දෙන්නේද ?

(ඇ). ඉහත "ආ" හි තොරතුරු වලට අනුව බදු දීමෙන් පසු නියමිත පරිදි බදු කුලී නොගෙවීම නිසා ගැටලු ඇති වී තිබෙන බදු කරුවන් හා එකී ආයතන නම් කරන්නේද?

(ඈ). පළාත් සභාවට අයවිය යුතු හිඟ බදු ප්‍රමාණයේ මුළු එකතුව කීයද?

(ඉ). බදු නොගෙවීම හේතුවෙන් පැන නැගී ඇති එකී ගැටළු පිළිබඳව මෙතෙක් ගෙන ඇති පියවර කවරේද?

(ඊ). නොඑසේනම් ඒ මන්ද?

05. ගරු රජිත රංගන හපුආරච්චිගේ මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට. (ප්‍ර/vi(1)/16/32)

(අ). I. කටාන ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශය තුළ පවතින කුඹුරු ඉඩම් ප්‍රමාණය කොපමණද?

II. එයින් කොපමණද ප්‍රමාණයක් දැනට වගා කරන්නේද?

(ආ). I. පසුගිය වර්ෂ 05 ඇතුළත කෘෂිකර්ම අමාත්‍යාංශය මගින් කොපමණ මුදල් ප්‍රමාණයක් කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට වෙන් කර තිබේද?

II. එලෙස මුදල් ප්‍රතිපාදන වෙන් කර තිබේනම් එම ව්‍යාපෘති මොනවාද?

(ඇ). I. ආඩිඅම්බලම, වල්පොල වෙල්යාය සංවර්ධනය කිරීම සඳහා එම ගොවි සංවිධාන මගින් ඔබතුමා වෙත ඉල්ලීම් කර තිබේද?

II. ඒ සම්බන්ධයෙන් ඔබතුමා ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

III. එම ඉල්ලීම් ඉටුකර ආඩිඅම්බලම, වල්පොල වෙල්යාය සංවර්ධනය කිරීම සඳහා ඔබතුමා ප්‍රතිපාදන වෙන් කරන්නේද?

**06. ගරු රජිත රංගන හපුආරච්චිගේ මන්ත්‍රීතුමා විසින් ගරු අධ්‍යාපන, සංස්කෘතික හා කලාකටයුතු හා ක්‍රීඩා හා යෞවන කටයුතු සහ තොරතුරු තාක්ෂණ පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට.**

(පු/vi(1)/16/33)

(අ). ඔබ අමාත්‍යාංශය යටතේ ඇති යෞවන කටයුතු යන්න ඔබ අමාත්‍යාංශය නිර්වචනය කරන්නේ කෙසේද?

(ආ). තරුණයන් යනුවෙන් ඔබ අමාත්‍යාංශය හඳුන්වන්නේ කුමන වයස් සීමා තුළ සිටින අයද?

(ඇ). යෞවන කටයුතු යන්නට ඔබ අමාත්‍යාංශයට අදාල කාර්යභාරය කුමක්ද?

(ඈ). ඒ එක් එක් කාර්යභාරය සපුරා ලීම සඳහා පසුගිය වසර තුළ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති මොනවාද?

(ඉ). එම ව්‍යාපෘති සඳහා වෙන්කර ඇති මුදල් ප්‍රමාණය කොපමණද?

(ඊ). තරුණ කටයුතු ඉටු කිරීම සඳහා බස්නාහිර පළාත් සභාව තුළ නිලධාරීන් කොපමණ ප්‍රමාණයක් සිටීද ?

(උ). එවැනි නිලධාරීන් නොමැති නම් තරුණ කටයුතු ඉටු කිරීම සඳහා ඔබ අමාත්‍යාංශය ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද?

07. **ගරු පී. ඩී. අබේරත්න මන්ත්‍රීතුමා විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට.** (ප්‍ර/vi(1)/16/34)

(අ). වලල්ලාවිට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ඉත්තැපාන ගොවිජන සේවා කාර්යාලය මගින් ඉත්තැපාන වගුරුබිම් ප්‍රදේශයේ පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා මූල්‍ය ආධාර ලබා දී තිබේද?

(ආ). එසේ නම් අක්කරයට ලබා දුන් මුදල කොපමණද? කී දෙනෙකුටද?

(ඇ). ලබා දුන් මුදල වෙන වෙනම නම් වශයෙන් සඳහන් කරන්නේද?

(ඈ). ආධාර ලාභීන් සියළු දෙනා දැනට ඉඩම් අස්වද්දා ප්‍රතිපල ලබා ඇත්ද?

(ඉ). ඉඩම් එළිපෙහෙලි කර නැති කී දෙනෙකුයට මුදල් ලබා දී ඇත්ද?

(ඊ). මෙම ව්‍යාපෘතිය සාර්ථක යැයි ඔබතුමා සෑහීමකට පත් වන්නේද?

(උ). එසේ නොමැති නම් ඔබතුමා ගන්නා පියවර කුමක්ද?

08 **ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු කෘෂිකර්ම, ඉඩම්, වාරිමාර්ග, සත්ව නිෂ්පාදන හා සෞඛ්‍ය, සහ ගොවිජන සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට.** (ප්‍ර/vi(1)/16/35)

(අ). I. කටාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ පීල්ලවත්ත පිහිටි කුඩා වැව සංවර්ධනය සඳහා වැව් 1000 ක් සැකසීමේ පසුගිය රජයේ ව්‍යාපෘතිය යටතේ වියදම් කරන ලද මුදල කොපමණද?

II. ඒ කුමන වර්ෂයකද?

(ආ). වැව් ප්‍රතිසංස්කරණයේදී වැව් බැම්ම නිසි ප්‍රමිතියකින් තොරව සෑදීම නිසා වැව් ඉස්මත්තේ පිහිටි ගම්මාන සියල්ල වැසි කාලවලදී වතුරෙන් යටවන බව ඔබතුමන් දන්නේද?

(ඇ). I. මෙම වැව ප්‍රතිසංස්කරණයෙන් පසු වගාබිම් සඳහා ජලය සපයන ලද්දේද?

II. එසේ වගාවන් සඳහා වැව් ජලය යොදා ගන්නේ නම් වගාකළ බිම් හෙක්ටයාර ප්‍රමාණය කොපමණද?

(ඈ). I. වසර 08කට අධික කාලයක් මෙම වැව් සොරොව්ව විවෘත කිරීමට නොහැකිව එහි සොරොව් යතුර අස්ථානගතව ඇති බව ඔබතුමා දන්නෙහිද?

II. ඊට වගකිව යුත්තේ කවුද?

(ඉ). වැව් ප්‍රතිසංස්කරණයේදී එයින් ඉවත් කළ පස් වලට සිදු වූයේ කුමක්ද?

**09. ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ප්‍රධාන අමාත්‍ය, සහ මුදල් හා ක්‍රම සම්පාදන ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජල සම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට.**

(ප්‍ර/vi(1)/16/36)

(අ). ඔබතුමා අමාත්‍යධුර භාරගත් දින සිට ඔබ අමාත්‍යාංශ යටතේ ඇති ආයතන සඳහා පත්කර ඇති සභාපතිවරුන්ගේ නම් (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) මොනවාද?

(ආ). ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) මොනවාද?

(ඈ). ඔබ අමාත්‍යධූරය භාරගත් දින සිට ඔබ අමාත්‍යාංශ යටතේ ඇති ආයතන වල පුරප්පාඩු සඳහා බඳවාගත් පිරිස (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) කොපමණද?

(ඇ). ඒ කුමන තනතුරු සඳහාද යන්න (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) දක්වන්න?

(ඉ). ඔබ අමාත්‍යාංශ යටතේ පවතින ආයතන වල මෙතෙක් බඳවා නොගත් පවතින පුරප්පාඩු (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) මොනවාද?

(ඊ). ඉහත කී ඔබ යටතේ පවතින ආයතන සඳහා නුපුහුණු හෝ ආධුනික වශයෙන් බඳවාගෙන ඇති පිරිස (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) කොපමණද?

**10. ගරු එම්. රෝස් ප්‍රනාන්දු මන්ත්‍රීතුමිය විසින් ගරු ධීවර, මාර්ග, ප්‍රවාහන, සමුපකාර සංවර්ධන, හා වෙළඳ, නිවාස හා ඉදිකිරීම්, චතුයටිතල පහසුකම්, කර්මාන්ත හා ග්‍රාම සංවර්ධන පිළිබඳ අමාත්‍යතුමාගෙන් ඇසීමට.**

(පු/vi(1)/16/37)

(අ). ඔබතුමා අමාත්‍යධූර භාරගත් දින සිට ඔබ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන සඳහා පත්කර ඇති සභාපතිවරුන්ගේ නම් (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) මොනවාද?

(ආ). ඔවුන්ගේ අධ්‍යාපන සුදුසුකම් (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) මොනවාද?

(ඈ). ඔබ අමාත්‍යධූරය භාරගත් දින සිට ඔබ අමාත්‍යාංශය යටතේ ඇති ආයතන වල පුරප්පාඩු සඳහා බඳවාගත් පිරිස (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) කොපමණද?

(ඇ). ඒ කුමන තනතුරු සඳහාද යන්න (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) දක්වන්න?

(ඉ). ඔබ අමාත්‍යාංශය යටතේ පවතින ආයතන වල මෙතෙක් බඳවා නොගත් පවතින පුරප්පාඩු (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) මොනවාද?

(ඊ). ඉහත කී ඔබ යටතේ පවතින ආයතන සඳහා නුපුහුණු හෝ ආධුනික වශයෙන් බඳවාගෙන ඇති පිරිස (ආයතන සඳහා වෙන් වෙන් වශයෙන්) කොපමණද?

VI. නොපැමිණ සිටීමේ අවසරය පිළිබඳ යෝජනා

VII. අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ

VIII. පෞද්ගලික පැහැදිලි කිරීම්

IX. පොදු කටයුතු

1. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.)

"බස්නාහිර පළාතේ 2015 අංක ........... දරණ මුදල් (සංශෝධන) ප්‍රඥප්තිය"

(දෙවනවර කියැවීම)

(ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියැවීම 2015-07-21 දින සිදු කර ඇත.)

(2015-12-10 දින පැවති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ වාර්තාව හා 2016-03-24 දින පැවති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ වාර්තාව හා සම්බන්ධයි.)

2. **ගරු ඉසුර දේවප්‍රිය- ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.)**

***බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරණ බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය යටතේ සාදන ලද රීති***

'බස්නාහිර පළාතේ පළාත් සභාවේ 2015 අංක 01 දරණ බඩු උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 53 වන වගන්තියේ විධිවිධාන යටතේ බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවරයා වශයෙන් පැවරී ඇති බලතල අනුව සාදනු ලැබ,

අංක 1937/20 හා 2015 ඔක්තෝබර් මස 22 වන බ්‍රහස්පතින්දා දාතමින් යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශේෂ ගැසට්පත්‍රය (IV (අ) වැනි කොටස- පළාත් සභා) මගින් ප්‍රකාශයට පත් කරන ලද,

"බස්නාහිර පළාතේ 2015 අංක 01 දරණ බඩු උකස් ගන්නන්ගේ රීති නම් වූ රීතීන්"

යථෝක්ත ප්‍රඥප්තියේම 53 (4) උපවගන්තියට අනුකූලව අනුමැතිය සඳහා මෙම පළාත් සභාවට 2015.12.22 දින ඉදිරිපත් කර ඇති අතර,

ඉදින් එදින, එහිදී ගත් තීරණය පරිදි, 2016.03.24 දින පැවති ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී ඒ පිළිබඳව තවදුරටත් සාකච්ඡා කර, එම කාරක සභා නිර්දේශයන් ඇතුළත් වාර්තාව 2016-04-05 දින මෙම පළාත් සභාවට පිළිගන්වනු ලද හෙයින් එම රීතීන් සම්බන්ධයෙන් ලද, එම කාරක සභා නිර්දේශයන් පිළිබඳවද සැළකිලිමත්ව ක්‍රියාකල යුතුය.'

3. ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රමසම්පාදන, ඉංජිනේරු සේවා, නීතිය හා සාමය, පළාත් පාලන හා පළාත් පරිපාලන, ආර්ථික ප්‍රවර්ධන, විදුලි බල හා බලශක්ති, පරිසර කටයුතු, ජලසම්පාදන හා ජලාපවාහන සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යතුමා (බ.ප.)

<u>යෝජනාව</u> :

'<u>2014 අංක 06 දරණ විසර්ජන ප්‍රඥප්තිය- 7 වන වගන්තිය ප්‍රකාරව පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම -2015 වර්ෂය.</u>'

'<u>අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම- 2015</u>' නැමති උපලේඛණයේ දැක්වෙන පරිදි අත්තිකාරම් සීමා සංශෝධනය කිරීමේදී 2014 අංක 06 දරණ විසර්ජන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින්ද,

එම සංශෝධනයන් සිදුකිරීම සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සභාවේ අනුමැතියට යටත්ව ලබා දී ඇති හෙයින්ද,

එම උපලේඛණයේ දැක්වෙන පරිදි එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කරයි.'

## X. පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ කටයුතු

**01. ගරු ලලිත් එල්ලාවල මන්ත්‍රීතුමා :**

'අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ නව රජය මගින පසුගිය රජය විසින් කරන ලදැයි කියන දූෂණ, වංචා, මිනීමැරුම්, රාජ්‍ය දේපල අයුතු ලෙස පරිහරණය කිරීම, පිළිබඳව මේ වන විටත්, ඒ සඳහා කමිටු පත් කරමින් වැරදි කරුවන්ට නීතිය මගින් දඬුවම් කිරීම සතුට කරුණකි.

1989 හා 1990 කාල වකවානුව තුළ තරම් මෙරටේ අති විශාල වශයෙන් රාජ්‍ය දේපල විනාශ කරමින් මිනිස් ඝාතන සිදු වූ කාල පරිච්ඡේදයක් මෑත ලංකා ඉතිහාසයේ නොමැත. එබැවින් මේ පිළිබඳව සොයාබැලීමට කමිටුවක් පත් කර එම රාජ්‍ය දේපල විනාශ කර මිනිස් ඝාතන සිදු කළ පුද්ගලයන්ට නීතිය මගින් දඬුවම් කිරීම හා විනාශ කළ රාජ්‍ය දේපලවල වටිනාකම අදාල වැරදිකරුවන්ගෙන් අයකර ගැනීම සඳහා අවශ්‍ය පියවර ගන්නා මෙන් අතිගරු ජනාධිපතිතුමාගෙන් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව ඉල්ලා සිටියි.'

(යෝ/vi(1)/15/02)

**02. ගරු මහින්ද ජයසිංහ මන්ත්‍රීතුමා :**

"පාසැල්වලට ළමුන් ඇතුළත් කර ගැනීම දැඩි අර්බුදකාරී තත්වයකට පත්ව ඇත.

පළමුවන ශ්‍රේණියට සහ හය වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා අනෙකුත් ශ්‍රේණි වලට ළමුන් ඇතුළත් කර ගන්නා ක්‍රමවේදයට සාපේක්ෂව වඩා විධිමත්වූ වැඩ පිළිවෙළක් සකස් වී තිබුණද, එම අනෙකුත් ශ්‍රේණි සඳහා ළමුන් ඇතුළත් කර ගැනීම සඳහා එවන් විධිමත් වැඩපිළිවෙලක් නොමැත. ඒ නිසාම ළමුන් ඇතුළත් කර ගැනීමේදී විවිධ අල්ලස් ගැනීම්, දූෂණ, විවිධ අක්‍රමිකතා සිදු වෙමින් පවතින බව දැනගන්නට ඇත.

එහෙයින්, පළමුවන ශ්‍රේණියට සහ හය වන ශ්‍රේණියට ළමුන් ඇතුළත් කර ගැනීමේදීදැනට ක්‍රියාත්මක වන්නාක් මෙන්ම, අනෙකුත් ශ්‍රේණි වලටද, ළමුන් ඇතුළත් කිරීම සඳහා වඩා විධිමත් වූ ක්‍රමවේදයන් සකස් කර බස්නාහිර පළාතේ පාසැල් වල ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු කරන මෙන් අදාල සියළු පාර්ශවයන්ගෙන් ඉල්ලා සිටිය යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අදහස් කරයි.'

(යෝ/vi(1)/15/04)

## XI. සභාව කල් තැබීම

කේ.එච්.ඩී.කේ. සමරකෝන්,
ලේකම්,
බස්නාහිර පළාතේ පළාත් සභාව.

2016.04.20 දින
සභා ලේකම් කාර්යාලය,
බස්නාහිර පළාතේ පළාත් සභාව,
5වන මහළ, B පර්යන්තය,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.